මගේ අංකය : JSC/SEC/CIR – L/2024

**<u>අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 04/2024</u>**

සියලුම මහේස්ත්‍රාත්වරුන් හා අතිරේක මහේස්ත්‍රාත්වරුන් සඳහා,

**<u>පුනරුත්ථාපනය සඳහා රැඳවියන් යොමු කිරීමේ දී සලකා බලන නිර්ණායකයන් නැවත ක්‍රියාත්මක කිරීම</u>**

ශීර්ෂගත කරුණට අදාලව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති), පියුමන්ති පීරිස් මහත්මිය විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් අමතන ලද 2024.01.01 දිනැති ලිපිය (ඇමුණුම් ද සමඟ) පිලිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපිය ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති), පියුමන්ති පීරිස් මහත්මිය විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් අමතන ලද 2024.01.01 දිනැති ලිපිය (ඇමුණුම් ද සමඟ) අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ පල කොට ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එස්. සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 මාර්තු මස 12 වෙනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ලේකම්
செயலாளர்
Secretary
දුරකථනය
தொலைபேசி
Telephone 2449959
ෆැක්ස් අංකය
பெக்ஸ் இல.
Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk
ප්‍රධාන කාර්යාලය
பொது அலுவலகம்
General Office
දුරකථනය
தொலைபேசி
Telephone 2323022
ෆැක්ස් අංකය
பெக்ஸ் இல.
Fax No. 2320785
Web Site: www.moj.gov.lk

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும்அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
Ministry of Justice, Prison Affairs and Constitutional Reforms

තැ.පෙ.
தபால்பெட்டி
P.O. Box. 555
ANNEXE A
ඉලෙක්ට්‍රොනික තැපැල
மின்அஞ்சல்
E-mail info@moj.gov.lk
නො 19,ශ්‍රී සංඝරාජ මාවත
කොළඹ 10
இல19, ஸ்ரீசங்கராஜ மாவத்த
கொழும்பு 10
No 19, Sri Sangaraja Mw
Colombo 10

මගේ අංකය
எனதுஇல
My No. MOJ/L8/05/01

ඔබේ අංකය
உமது. இல.
Your No.

දිනය
திகதி
Date 2024.01. 01

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

කොළඹ -12.

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT COLOMBO 12
B/4
0 2 JAN 2024

<u>පුනරුත්ථාපනය සඳහා රැඳවියන් යොමු කිරීමේ දී සලකා බලන නිර්ණායකයන් නැවත ක්‍රියාත්මක කිරීම</u>

උක්ත කරුණට අදාළව පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් විසින් එවන ලද අංක පුනකා/නීති/නීතිපති උපදෙස්/01/2023 (11) හා 2023.12.18 දිනැති ලිපිය හා බැඳේ. (අදාළ ලිපියේ පිටපතක් අමුණා ඇත.)

02. ඒ අනුව, එකී ලිපියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් මින් ඉදිරියට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනයට යොමු කිරීමේ දී පුනරුත්ථාපන නඩුවට අමතරව ඔවුන් හට ගොනු කර ඇති අනෙකුත් නඩු අවසන් වූ අයවළුන් පමණක් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සලස්වා දෙන ලෙස පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් විසින් මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම සම්බන්ධව විශේෂ අවධානය යොමු කර අවශ්‍ය පියවර ගැනීම සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

පියුමන්ති පීරිස්
අතිරේක ලේකම් (නීති)
ලේකම් වෙනුවට
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත්:-

1. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් - ඔබගේ අංක පුනකා/නීති/නීතිපති උපදෙස්/01/2023 (11) හා 2023.12.18 දිනැති ලිපිය සම්බන්ධව කරු. දැ.ගැ.ස.

2. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - කරු. අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා

පුනරුත්ථාපන කාර්යාංශය
புனர்வாழ்வுப் பணியகம்
BUREAU OF REHABILITATION
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS

අංක: 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல: 462/2, கடுவெல வீதி, கனஹேன, பத்தரமுல்லை.
No: 462/2 ,Kaduwela Road, Sinhahena , Battaramulla.


මගේ අංකය / எனது இல / My No: පුනකා/නීති/නීතිපති උපදෙස්/01/2023 (11)

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය: 2023.12.18

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

ගරු ලේකම්තුමියනි,

**<u>පුනරුත්ථාපනය සඳහා රැඳවියන් යොමු කිරීමේදී සලකා බලන නිර්නායකයන් නැවත ක්‍රියාත්මක කිරීම</u>**

යොමුව :

අ. අංක පුනකොප/නීති/ නීතිපති උපදෙස් /01/2022 (02) හා 2022.08.16 දිනැති මෙම කාර්යාංශ ලිපිය (පිටපතක් අමුණා ඇත)

ආ. පුනකා/නීති/නීතිපති උපදෙස් /01/2023 (09) හා 2023.06.16 දිනැති මෙම කාර්යාංශ ලිපිය (පිටපතක් අමුණා ඇත)

1. මෙම කාර්යාංශය යටතේ ක්‍රියාත්මක පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමේදී මධ්‍යස්ථාන තුල පැවති සීමිත සම්පත්, ඉඩ පහසුකම් හා ඇතැම් පුනරුත්ථාපනලාභීන් විසින් මධ්‍යස්ථාන තුල විවිධ කල කෝලාහල සිදු කිරීම යන කරුණු සැලකිල්ලට ගනිමින් එම ගැටළු පාලනය කිරීමේ අරමුණින් යුක්තව යොමුගත ''අ'' ලිපිය මගින් ඉදිරිපත් කරන ලද නිර්නායකයන් යටතේ පුනරුත්ථාපනය සඳහා රැඳවියන් යොමු කිරීමට කටයුතු කරන ලදී.

2. එහෙත් බන්ධනාගාර තුල පැවති තදබදය අවම කර ගැනීමට විසඳුමක් වශයෙන් යොමුගත ''අ'' ලිපිය මගින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් නිර්නායකය තාවකාලිකව ලිහිල් කොට පුනරුත්ථාපනයට යොමු කිරීමට යෝජනා කරන ලදී.

   අ. දරුණු ගණයේ අපරාධ නඩු වලට හැර (මිනිමැරුම් චෝදනා,ස්ත්‍රී දූෂණ හා මං කොල්ලකෑම් ආදිය) සුළු වැරදි සඳහා ගරු අධිකරණයන්හි විභාග වෙමින් පවතින නඩු සඳහා යොමු කල යුතු අයවළුන්

3. එහෙත් මේ වන විට පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි පුනරුත්ථාපනය කල හැකි උපරිම ධාරිතාවය ඉක්මවා ඇති බැවින් මින් ඉදිරියට මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනයට යොමු කිරීමේදී පුනරුත්ථාපන නඩුවට අමතරව ඔවුන් හට ගොනු කර ඇති අනෙකුත් නඩු අවසන් වූ අයවළුන් පමණක් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා යොමු කිරීමට අවැසි ඉදිරි කටයුතු සිදු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩී ඩී යූ කේ හෙට්ටිආරච්චි ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එම්ෆ්
මේජර් ජෙනරාල් (විශ්‍රාමික)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්

පිටපත :

1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්


දුරකථන / தொலைபேசி: +9411 2577457
ෆැක්ස් / தொலைநகல்: +9411 2883737
විද්‍යුත් තැපැල / மின்னஞ்சல்: bcg.rehabilitation@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம்: .gov.lk

73/5

# පුනරුත්ථාපන කාර්යාංශය
# புனர்வாழ்வுப் பணியகம்
# BUREAU OF REHABILITATION

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS

අංක 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல: 462/2, கடுவெல வீதி, கனஹேன, பத்தரமுல்ல.
No: 462/2 ,Kaduwela Road , Ganahena , Battaramulla.

මගේ අංකය / எனது இல / My No } පුනකා/නීති/නීතිපති උපදෙස්/01/2023 ( )
ඔබේ අංකය / உமது இல / Your No }
දිනය / திகதி / Date } 2023.06. 16

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,

ගරු ලේකම්තුමියනි,

<u>පුනරුත්ථාපනය සඳහා රැඳවියන් යොමු කිරීමේදී සලකා බලන නිර්නායකයන් ලිහිල් කිරීම.</u>

යොමුව :

අ. පුනකොප/නීති/නීතිපති උපදෙස් /01/2022 (02) හා 2022.08.16 දිනැති මෙම කාර්යාංශ ලිපිය. (පිටපතක් අමුණා ඇත)

1. මෙම කාර්යාංශය යටතේ ක්‍රියාත්මක පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමේදි මධ්‍යස්ථාන තුල පැවති සීමිත සම්පත්/ඉඩ පහසුකම් හා ඇතැම් පුනරුත්ථාපනලාභින් විසින් මධ්‍යස්ථාන තුල විවිධ කල කෝලාහල සිදු කිරීම යන කරුණු සැලකිල්ලට ගනිමින් එම ගැටළු පාලනය කිරීමේ අරමුණින් යුක්තව යොමුගත ලිපිය මගින් ඉදිරිපත් කරන ලද නිර්නායකයන් යටතේ පුනරුත්ථාපනය සඳහා රැඳවියන් යොමු කිරීමට කටයුතු කරන ලදී.

2. එහෙත් බන්ධනාගාර තුල දැනට පවතින තදබදය අවම කර ගැනීමට විසඳුමක් වශයෙන් යොමුගත ලිපිය මගින් ඉදිරිපත් කරන ලද නිර්නායකයන් පහත සඳහන් පරිදි තාවකාලිකව ලිහිල් කොට පුනරුත්ථාපනය සඳහා රැඳවියන් යොමු කිරීම සුදුසු බැව් පෙන්වා දෙමි.

අ. පුනරුත්ථාපනය සඳහා යොමු කරනු ලබන රැඳවියන්ගේ උපරිම වයස් සීමාව අවු 45 සිට 60 දක්වා වැඩි කිරීම.

ආ. දරුණු ගණයේ අපරාධ නඩු වලට හැර (මිනී මැරුම් චෝදනා, ස්ත්‍රී දූෂණ හා මං කොල්ලකෑම් ආදිය) සුළු වැරදි සඳහා ගරු අධිකරණයන්හි විභාග වෙමින් පවතින නඩු සඳහා යොමුකල යුතු අයවළුන්

3. බන්ධනාගාරගත මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූ රැඳවියන් වැඩි පිරිසක් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමෙන් බන්ධනාගාර තුල දැනට පවතින තදබදය යම්තාක් දුරට අවම කිරීමේ හැකියාවක් පවතී. එබැවින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමේදී සංශෝධනය කරන ලද ඉහත සඳහන් නිර්නායකයන් කෙරෙහි අවධානය යොමු කොට ක්‍රියා කිරීමට අවැසි ඉදිරි කටයුතු සිදු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

(signature)

ඩී ඩී යූ කේ හෙට්ටිආරච්චි ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩියු පිඑස්සි එම්ජ්
... ජෙනරාල් (විශ්‍රාමික)
...රුත්ථාපන කොමසාරිස් ජනරාල්

...

...න්ධනාගාර කොමසාරිස් ජනරාල්